# පුරාතන ලංකාවෙන් හමුවන සෙරමික් භාණ්ඩ (පිඟන් භාණ්ඩ)පිළිබඳ අධ්‍යයනයක්

එම්.එච්.එම්.ඒ.ඒ. මල්විල

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ayeshamalvila@gmail.com

මුඛ්‍ය පදඃ සෙරමික්, මැටි බඳුන්, උපයෝගීතාවය, අමුද්‍රව්‍ය

## හැඳින්වීම

ශ්‍රී ලංකාව ඈත අතීතයේ පටන් දේශීය හා විදේශීය වෙළඳාමේ කේන්ද්‍රස්ථානයකි. ශ්‍රී ලංකාව ආර්ථික, සමාජීය, ආගමික, සංස්කෘතික හා දේශපාලනමය වශයෙන් ඉතා පුළුල් සම්බන්ධතාවයක් අනෙක් රටවල් සමඟ පැවැත් වූ බව පුරාවිද්‍යාත්මක හා ලිඛිත මූලාශ්‍රය තුළින් පැහැදිළි වේ. ශ්‍රී ලංකාවේ වටා පැවැති සමුද්‍රය මෙම සම්බන්ධතා වඩාත් තීව්‍ර වීමට හේතු වී ඇත. එම සම්බන්ධතාවලින් ලද ඇතැම් පුරාවිද්‍යා අවශේෂ අදටත් නොනැසී පවතින අතර සෙරමික් නිෂ්පාදන ඒ අතර වැදගත් තැනක් උසුලයි. පුරාතන වරායවල් අතර විශේෂයෙන් මාන්තායි, ගොඩවාය, ත්‍රිකුණාමලය, මන්නාරම ආදි වරාය ආශ්‍රිත ව ද අනුරාධපුර ඇතුළුනුවර යාපහුව ආදී අභ්‍යන්තර ස්ථානවලින් ද මෙම සෙරමික් භාණ්ඩ හඳුනාගත හැකිය. මෙම භාණ්ඩ දේශීය හා විදේශීය ලෙස දෙවර්ගයකි. මූලද්‍රව්‍ය අනුව එම වර්ගීකරණය සිදුව ඇත. විවිධ හැඩ රටා මෝස්තර සහිත විවිධ උපයෝගීතාවයන්ට අනුව වෙනස් වූ මෙම සෙරමික් නිෂ්පාදන පුරාණ ලංකාවේ සමාජ ආර්ථික, දේශපාලන, සංස්කෘතික තොරතුරු රාශියක් මතුකර ගැනීමට උපකාරි වේ. එම සෙරමික් නිෂ්පාදන හරහා මෙරට පැවැති විදේශ සම්බන්ධතාවයන් හා ආර්ථික තත්ත්වය හඳුනාගැනීම, එහි උපයෝගීතාවය, නිෂ්පාදිත අමුද්‍රව්‍ය, නිෂ්පාදිත ආකාරයහා සුවිශේෂි ලක්ෂණ පිළිබඳ අධ්‍යනය මෙහි මුඛ්‍ය අරමුණ වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතීයියික මූලාශ්‍රයන් යොදාගත් අතර ක්ෂේත්‍ර අධ්‍යනය යටතේ කෞතුකාගාර අධ්‍යනය සිදු කරන ලදි. එමෙන්ම පුස්තකාල අධ්‍යනය ද වැඩිදුර අධ්‍යයන සඳහා අන්තර්ජාලය අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා ද සිදු කරන ලදි. සෙරමික් භාණ්ඩ අතීත සමාජ පරිසරය තුළ උපයෝගී කරගත් අයුරු, ලංකාව තුළට සෙරමික් භාණ්ඩ ආනයනය, හුවමාරුව, නිෂ්පාදන තාක්ෂණ ක්‍රමවේදය, භාවිත අමුද්‍රව්‍ය ආදිය අධ්‍යයනය කර තොරතුරු විශ්ලේෂණය කරන ලදී. මෙලෙස ලබාගත් අධ්‍යයන තොරතුරු පර්යේෂණ පත්‍රිකා හා විද්‍යුත් බහුමාධ්‍ය ක්‍රමවේද හරහා ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ය.

## ප්‍රතිඵල හා සාකාච්ඡාව

ශ්‍රී ලංකාවේ පුරාණ වරායවල් හරහා විශේෂයෙන් මෙ රට විදේශීය සෙරමික් නිෂ්පාදන ලබාගෙන තිබේ. සෙරමික් නිෂ්පාදන ඇතැම් අමුද්‍රව්‍ය හා මෝස්තර රටා ඒවා නිර්මිත රට නිෂ්පාදිත පුද්ගලයන් හෝ ස්ථාන හඳුනාගැනීමට ඉවහල් වේ.

ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සෙරමික් භාණ්ඩ සඳහා මේ විදේශීය ආභාසය ලැබී ඇති බව හඳුනාගත හැකිය. එම රටවල් හා ශ්‍රී ලංකාව ඉතා තියුණු සම්බන්ධතා පවත්වා ඇති අතර චීනය, ඉස්ලාම් රටවල් මෙන්ම ඉන්දියාවට අයත් සෙරමික් නිෂ්පාදන බහුලව හමුවේ. එම රටවල් හා ශ්‍රී ලංකාව අතර පැවැති සම්බන්ධතාවල ප්‍රතිඵල ලෙස මෙම භාණ්ඩ මෙරටට ආනයනය කර ඇත. විවිධ උපයෝගීතා අනුව මෙම නිෂ්පාදන සිදුකර ඇති අතර පානීය අවශ්‍යතා, සේදීම්, ගබඩා කර ගැනීම, ආහාර තබා ගැනීම වැනි අවශ්‍යතා අනුව මෙම භාණ්ඩ නිෂ්පාදනය වේ. නෞකාවලින් ගෙන එන ලද මෙම නිෂ්පාදන අතර වයින්, ජලය, මෙන්ම වෙනත් දෑ ගබඩා කිරීමත් සිදු වේ. පිඟන්, පීරිසි, කෝප්ප, කළ, පියන් වර්ග මෙම භාණ්ඩවලට අයත් ය. මෙම සෙරමික් භාණ්ඩ තුළ නිර්මාණය කර ඇති මෝස්තර රටා විවිධාකාරය. විවිධ වර්ණවලින් නිර්මාණය කර ඇති අතර සත්ව රූප, විවිධ මෝස්තර, මල්කොළ, විවිධ රේඛා, ජ්‍යාමිතික හැඩතල, එහි දී හඳුනාගත හැකිය. ඒ තුළ සෙරමික් භාණ්ඩ නිර්මාණකරුවාගේ කලාත්මක චින්තනය ඉතාම හොඳින් නිරූපණය වේ. ඔහු සංස්කෘතිකමය තත්ත්වයන් හා ස්වභාව ධර්මය උපයෝගී කරගෙන මෙම මෝස්තර හා කලාංග නිර්මාණය කරගෙන ඇත.

මෙහි දී නිර්මාණය සඳහා අමුද්‍රව්‍ය ලෙස විවිධ ඛණිජ ද්‍රව්‍ය උපයෝගී කරගෙන ඇත. විශේෂ මැටි මේ සඳහා යොදා ගැනෙනු අතර, ද්‍රවශීලි මැටි ද්‍රාවණය ද යොදා ගැනේ. මෙම සෙරමික් භාණ්ඩ ලංකාව වටා සමුද්‍ර වරායන් ආශ්‍රිතව මෙන්ම ඇතුළු නුවර, පොළොන්නරුව, යාපහුව ආදී ස්ථානවලින් හමුවන අතර මෙරට පුරාණ වරායන් ඉතා දියුණු වෙළඳ මධ්‍යස්ථාන විය. විදේශ සම්බන්ධතා පුළුල්ව එ කල පැවැත් වූ බවත් ඉතා හොද සංස්කෘතික සම්බන්ධතාවයක් තිබූ බවට මෙම සෙරමික් නිෂ්පාදන තුළින් පෙනේ. චීන, ඉස්ලාමික් සබඳතා එම රටවල නිෂ්පාදිත මෙරටට ආනයනය කරන ලද සෙරමික් නිෂ්පාදන සාධක තුළින් මනාව පැහැදිළි වේ. අතීතයේ පටන් ඉතා හොද මිත්‍රත්වයක් මෙරට පැවැති බවට ජාතික කෞතුකාගාරයේ ඇති සෙරමික් ප්‍රදර්ශන කුටියේ හමුවන සෙරමික් නිෂ්පාදන තුළින් පෙනේ. දේශීය, විදේශීය නිෂ්පාදන රාශියක් එහි ඇති අතර 17 වැනි හා 18 වැනි සියවස්වලට ඒවා අයත් වේ. ඒ අතර ජෝගු, පිඟන්, බඳුන් නාන කාමර උපකරණ ඇත.

ලංකාව වටා පැවැති වරායන් රාශියකින් මෙම සොරමික් සාධක හමුවේ. ඒ අනුව පැහැදිළි වන කරුණු කිහිපයකි. එනම්,

- මෙරටට දේශපාලන ස්ථාවර භාවය හා යහපත් තත්ත්වය
- විදේශ සම්බන්ධතාවය
- ශක්තිමත් ආර්ථිකයක් පැවැති බව
- විවිධ සමාජ මට්ටම් පැවති බව
- නිෂ්පාදනාගාර හා කර්මාන්තයක් ලෙස පවත්වාගෙන යාම පිළිබඳ

මේ කරුණු අනුව සෙරමික් භාණ්ඩ ආනයනයට මෙරට පැවැති සමාජ ක්‍රමය බලපා ඇත. ඔවුන්ගේ ශක්තිමත් ආර්ථිකය ඉන් කැපීපෙනේ. සෙරමික් භාණ්ඩ පරිහරණය කිරීමට උචිත වටපිටාවක් හා සමාජ ක්‍රමයක් පැවැති බවට මින් හඳුනාගත හැකි ය. වරායවලට ගෙන එනු ලබන සෙරමික් භාණ්ඩ රට පුරා අවශ්‍යතා අනුව ප්‍රවාහනය කරමින් රට අභ්‍යන්තරයට ගෙනගොස් ඇත. යාපහුව, පෙළොන්නරුව, අනුරාධපුර ඇතුළුනුවර යන ස්ථානවලින් හමුවන සාධක ඊට නිදසුන් වේ. 1980-1948 කැණීම් තුළින් හමුවන චීන මැටි බඳුන් රාශියක් අනුරාධපුරයෙන් හමු වේ.එසේ ම ජේතවන භූමියෙන් හමුවූ චීන මැටි බඳුන් හා අභයගිරි ස්තූපයේ පාදමේ

කළකැණීමෙන් චීනයේ සන් රාජවංශයට අයත් මැටි භාණ්ඩ 16 ක් සොයාගෙන තිබීමෙන් සෙරමික් එම සමාජය තුළ බහුලව භාවිතයට ගෙන ඇති බව හැකිය. මීට අමතරව දානය පිළිගැන්වීම සඳහා ද මෙම සෙරමික් නිෂ්පාදන භාවිතයට ගෙන ඇත. මෙම නිෂ්පාදන අනුකරණය කරමින් මෙ රට සෙරමික් නිෂ්පාදන සිදු කර ඇති බවට විශ්වාස කෙරේ. යාපහුව කැණීම් මඟින් හමුවන සෙලඩන් බඳුන් මාකෝ පොලෝ විසින් බුදුන්වහන්සේගේ පාත්‍රය බව විශ්වාස කෙරෙන අතර එහි සිතුවම් සහිත මැටි බඳුනක් ඇතුළු මැටි බඳුන් කිහිපයක් හමුවී ඇත (Graham, 2013). ඒ තුළ මෙරටට එම දැනුම ලබාගෙන මෙරටට ගැලපෙන ලෙස අමුද්‍රව්‍ය වෙනස් කරමින් මෙම භාණ්ඩ නිෂ්පාදනය කර ඇති බවට හඳුනාගත හැකිය.

සමස්ථයක් ලෙස ගත්කල දේශීය හා විදේශීය සෙරමික් භාණ්ඩ මෙ රටට විවිධ ප්‍රදේශවලින් හමු වේ. විවිධ අමුද්‍රව්‍ය හා තාක්ෂණික ක්‍රම භාවිත කර නිෂ්පාදිත මෙම බඳුන් ඉතා උසස් සමාජයන් තුළ පරිහරණය වූ බවට උපකල්පනය හැකිය. විවිධ උපයෝගීතා සඳහා විවිධ හැඩැති නිෂ්පාදන හඳුනාගත හැකිය. මෙම භාණ්ඩ විශේෂයෙන් වරායන් තුළින් සෙරමික් සාධක බහුලව හමු වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ:**


Carswell, J,. Deraniyagala, S., Graham, A.(2013)***Manthai***.Colombo: Archeological Department of Sri Lanka.

A Guide To National Museum Colombo.( 2012) Colombo: Department of National Mudeum